# ඡන්දදායකයන්ට සූදානම් කළ භෝජන සංග්‍රහ මැ. කො. නවතයි

2 පිටුවට

ඇල්පිටිය - චන්ද්‍රසිරි ගුණසේකර, මහනුවර - කේ. එල්. සුරවීර

## ඡන්දදායකයන්ට...

ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණයට පොදුජන එක්සත් නිදහස් සන්ධානයෙන් කුසලානය ලකුණින් ඉදිරිපත්ව සිටින අපේක්ෂකයකුගේ නිවසේ සිය ඡන්දදායකයන් 150ක් සඳහා රාත්‍රී භෝජන සංග්‍රහයකට පිළියෙල කර තිබූ ආහාරපාන භාජන සමඟම අත්අඩංගුවට ගත් බව ඇල්පිටිය පොලිසිය පවසයි.
මැතිවරණ නීති උල්ලංඝනය කරමින් මෙම අපේක්ෂකයාගේ කොට්ඨාසයේ ඡන්දදායකයන් පිරිසකට ඔක්තෝබර් මස 18 වැනි දින රාත්‍රී සංග්‍රහ කිරීම සඳහා ආහාරපාන පිළියෙල කර ඇති බවට ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණ නිරාකරණ මධ්‍යස්ථානය මඟින් ඇල්පිටිය පොලිසියට ඉකුත් (18දා) රාත්‍රී 10.00ට පමණ කරන ලද දැනුම්දීමක් මත ඇල්පිටිය මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක අනුර විජේසිංහ මහතා ඇතුළු පොලිස් කණ්ඩායමක් සහ ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණ සහකාර කොමසාරිස් ලසන්ත මහතා එම ඡන්ද අපේක්ෂකයාගේ නිවසට ගොස් කරන ලද පරීක්ෂණයේදී ඔහුගේ නිවසේ පිළියෙල කර තිබූ කහබත්, පරිප්පු, කුකුළු මස් ඇතුළු පිසූ ආහාරපාන එම භාජන සමඟම පොලිස් අත්අඩංගුවට ගෙන තිබේ. අපේක්ෂකයාගේ ආධාරකරුවන් හා ඡන්දදායකයන් 150කට එදින රාත්‍රී භෝජන සංග්‍රහයක් පිරිනැමීම සඳහා මෙම ආහාරපාන පිළියෙල කර තිබී ඇති බව පොලිස් පරීක්ෂණවලදී හෙළිවී තිබේ. පොලිසිය එම නිවසට යනවිටත් ඔහුගේ ඡන්දදායකයන් එකසිය පනහක් පමණ එම නිවසේ සිටිය බවද පොලිසිය කියයි.
මෙවර පැවැත්වෙන ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය සඳහා පොදුජන එක්සත් නිදහස් සන්ධානයෙන් (කුසලානය ලකුණින්) ඉදිරිපත්ව සිටින ඇල්පිටිය පොලිස් වසමේ 04 කණුව පිටුවල, ඇල්පිටිය යන ලිපිනයේ පදිංචි පිටුවල කංකානම්ගේ දොන් සරත් කුමාර අල්විස් යන අයගේ නිවසේ පිළියෙල කර තිබූ පිසූ ආහාර මෙසේ පොලිස් අත්අඩංගුවට ගෙන තිබේ.
මෙම අපේක්ෂකයා මෙවර පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සඳහාද ගාල්ල දිස්ත්‍රික්කයේ අපේක්ෂකයෙකු ලෙස ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් පෙරමුණෙන් (ගෑස් සිලින්ඩරය ලකුණින්) ඉදිරිපත්ව සිටින අයෙකි.
එසේම මැතිවරණ නීති උල්ලංඝනය කරමින් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ මහනුවර දිස්ත්‍රික් අපේක්ෂකයකු විසින් පේරාදෙණිය තානායමේදී පාක්ෂිකයන් පිරිසකට රාත්‍රී ආහාරය සමඟ ලබා දීමට සැලසුම් කර තිබූ මත්පැන් සාදයක් අත්හිටුවීමට මහනුවර මැතිවරණ කාර්යාලයේ නිලධාරීන් පියවර ගෙන තිබේ.
පැෆරල් සංවිධානය මඟින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලකට අනුව 18දා පස්වරු 6.00ට පමණ එම ස්ථානයට ගිය මැතිවරණ කාර්යාලයේ නිලධාරීන් හෝටල් පරිපාලනයට දැනුම්දී ඇත්තේ මැතිවරණය සඳහා තරග වදින අපේක්ෂකයන් විසින් සංවිධානය කරන රැස්වීම්වලට සහභාගි වන පාක්ෂිකයන්ට ආහාරපාන ආදියෙන් සංග්‍රහ කිරීම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් බවයි.
මෙම රැස්වීම සඳහා හිටපු මන්ත්‍රීවරුන් වන මහින්දානන්ද අලුත්ගමගේ, අනුරාධ ජයරත්න යන මහත්වරු ඇතුළු පිරිසක් සහභාගි වීමට නියමිතව සිට ඇත.
රැස්වීමට සහභාගි වූ සිය දෙනකුට පමණ අදාළ ස්ථානයේදී රාත්‍රී ආහාරය ලබා දීමට සැලසුම් කර තිබුණු බව මහනුවර මැතිවරණ කාර්යාලය පවසයි.